# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2487/30 – 2026 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා – 2026.05.07**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ ( 123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්:

1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දිවුලපිටිය, කුඩාගම්මන, නො. 162/1/ඒ දරන ස්ථානයේ පිහිටි “වින්ග්ස් ඔෆ් චේන්ජ්” නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. ළමුන් සඳහා මූලික පොත් සහ ලිපි උපකරණ සැපයීම:
සියලුම සිසුන්ට ඉගෙනීමට අවශ්‍ය මූලික උපකරණ ලබා දීමෙන්, ඔවුන්ගේ අධ්‍යාපනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට සහ පවුල් මත ඇති ආර්ථික බර අඩු කිරීමට උපකාරී වීම.

ii. පාසල් සඳහා අවශ්‍ය පදනම් පහසුකම් සැපයීම:
පන්තිකාමර හා ක්‍රීඩාංග වැනි පාසලට අවශ්‍ය ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු මඟින් පාසල්වල භෞතික පරිසරය දියුණු කරමින්, ඉගෙනීම හා සිසු සුභසාධනය සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට දායක වීම.

iii. පුස්තකාල පහසුකම් සැපයීම සහ වැඩිදියුණු කිරීම:
විවිධ පොත්, සම්පත් සහ ඩිජිටල් මෙවලම්වල ප්‍රවේශය ලබා දීමෙන් සිසුන්ගේ ස්වයං ඉගෙනීම, විචාරශීලී චින්තනය සහ අධ්‍යාපනික සංවර්ධනය කිරීම.

iv. ශිෂ්‍යත්ව ප්‍රදානය:
අඩු ආදායම් පවුල්වලින් පැමිණෙන, සුදුසුකම් සහිත සිසුන්ට අධ්‍යාපනික කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට ආර්ථික සහය

1A – G46736 – 04 (2026/05)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ලබා දීම.

V. අධ්‍යාපනික ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම:
ගුරු හා සිසුන් සඳහා වැඩමුළු සංවිධානය කරමින්, නව ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දීම, නවීන ඉගෙනුම් ක්‍රමවේද උදෙසා නව සංකල්ප හඳුන්වා දීම සහ පුද්ගලික හා වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීම සඳහා අවස්ථා සපයා දීම.

vi. දෙමාපිය හා ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් පැවැත්වීම :
වැඩමුළු හා රැස්වීම් මගින් දෙමාපියන් හා ප්‍රාදේශීය ප්‍රජාවන් අධ්‍යාපනික ක්‍රියාවලියට සම්බන්ධ කර ගනිමින්, සිසුන්ගේ සාර්ථකත්වය සඳහා සහාය වන පරිසරයක් නිර්මාණය කිරීම.

vii. ගුරු පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය වැඩසටහන්:
ගුරු පුහුණු වැඩසටහන් මගින් නව ඉගැන්වීම් ක්‍රම හා තාක්ෂණික දැනුම ලබා දීමෙන්, සිසුන්ගේ ඉගෙනුම් පරිසරය තවදුරටත් වැඩි දියුණු කිරීම.

viii. වෘත්තීය උපදෙස් හා මගපෙන්වීම් සේවා සැපයීම:
සිසුන්ට විවිධ වෘත්තීය මාර්ග පිළිබඳ දැනුම ලබා දීම, උපදේශන සේවා සහ පළපුරුදු මග පෙන්වීම් ලබා දීම මගින් ඔවුන්ට තම අනාගතය පිළිබඳ නිවැරදි තීරණ ගැනීමට උපකාරී වීම.

ix. ඩිජිටල් ඉගෙනුම් මෙවලම් සහ තාක්ෂණ ඒකාබද්ධ කිරීම:
පරිගණක, ටැබ්ලට් හා ඩිජිටල් ඉගෙනුම් වේදිකා ලබා දීම මගින් සිසුන්ගේ ඩිජිටල් දැනුම වර්ධනය කරමින්, නවීන අධ්‍යාපනික ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ වීමේ හැකියාව වැඩි කිරීම.

2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා
සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 අප්‍රේල් මස 23 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 05 - 0029/1

---

## සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ ( 123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්:

1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සිනමන් ග්‍රෑන්ඩ් කොළඹ, කෝර්ට් යාර්ඩ් වින්ග්, 9 වන මහල, කාමර අංක 951 සහ 952, 77, ගාලු පාර, කොළඹ 03 දරන ස්ථානයේ පිහිටි “ චාර්ටඩ් මැනෙජ්මන්ට් ඉන්ස්ටිටියුට් එස්එල් බ්‍රාන්ච්” නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

I. ආයතනයේ මෙහෙවර සඳහා සහය වීම.

II. කළමනාකරුවන්ගේ හැකියාවන් ඔවුන්ගේ සම්පූර්ණ වෘත්තීය ජීවිතය පුරා වර්ධනය කර ගැනීම සඳහා ආයතනය විසින් අනුගමනය කරන උපායමාර්ගය ප්‍රවර්ධනය කිරීම.

III. වෘත්තීය සුදුසුකම් ලබාදෙන උසස් කළමනාකරණය පිළිබඳ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

IV. ආයතනය විසින් කලින් කලට හඳුන්වා දිය හැකි, ආයතනය විසින් අනුමත කරන ලද පරීක්ෂණ පවත්වන කටයුතු වල නිරත වීම.

V. ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික පරිසරය තුළ වෘත්තීය කළමනාකරණ ප්‍රවණතා පිළිබඳ සාමාජිකයින්ට ඉදිරිපත් වාසියක් ලබාදීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා යාවත්කාලීන කර ගැනීමත්, සාමාජිකයින්ගේ අදහස් හා අපේක්ෂාවන් ප්‍රතිබිම්බනය කිරීමත් සඳහා වැඩසටහන්, දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, ශ්‍රව්‍ය - දෘශ්‍ය ද්‍රව්‍ය හා ප්‍රකාශන සංවිධානය කිරීම.

VI. දේශීය හා විදේශීය අනෙකුත් කළමනාකරණ ආයතන, වෘත්තීය සංවිධාන, වෙළඳ මණ්ඩල, ව්‍යාපාරික හා රාජ්‍ය ආයතන සමඟ සබඳතා ඇති කරගෙන සංවාදය වර්ධනය කිරීම.

VII. දකුණු ආසියානු කලාපයේ වෘත්තීය කළමනාකරණ විශිෂ්ටත්වයේ ප්‍රධාන බලවේගයක් ලෙස මතුවීම සඳහා සාමාජිකත්ව වර්ධනය කිරීම.

VIII. ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පුද්ගලික අංශ දෙකෙහිම හොඳ කළමනාකරණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට සහය දැක්වීම.

IX. සාමාජිකයින් විසින් තම තරාතිරම් මාරු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව ඔවුන්ට උපදෙස් ලබාදීම.

2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා
සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 අප්‍රේල් මස 23 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 05 - 0029/2

---

## සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ ( 123 අධිකාරය) 3 වන හා 4 වන වගන්ති වලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්:

1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඩිපාර්ට්මන්ට් ඔෆ් පිසියොලොජි, ෆැකල්ටි ඔෆ් මෙඩිසින්, කොළඹ විශ්ව විද්‍යාලය, නො. 25, කින්සි පාර, කොළඹ 08 දරන ස්ථානයේ පිහිටි " සවුත් ඒසියන් ඇසෝසියේෂන් ඔෆ් පිසියෝලෝජිස්ට්ස්" නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

(i) දකුණු ආසියානු කලාපයේ කායික විද්‍යා ක්ෂේත්‍රයට අයත් සියලු අංශවල සක්‍රීයව කටයුතු කරන වෘත්තිකයන් අතර නායකත්වය හා තොරතුරු හුවමාරුව තුලින් සංවාදය සහ සහයෝගීතාවය උත්තේජනය කිරීම සඳහා සංසදයක් සැපයීම.

(ii) කලාපයේ කායික විද්‍යා ක්ෂේත්‍රයේ සාමාජිකයින් අතර කාර්යක්ෂම සන්නිවේදනයක් ස්ථාපනය කිරීම. තවද, සවුත් ඒසියන් ඇසෝසියේෂන් ඔෆ් පිසියෝලෝජිස්ට්ස් සමිතිය විසින් කාලානුරූපව සමුළු සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කරමින්, ඊට සමාන හෝ සම්බන්ධිත අරමුණු සහිත වෙනත් සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා
සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය.

2026 අප්‍රේල් මස 27 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 05 - 0029/3

---

## සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ ( 123 අධිකාරය) 3 වන හා 4 වන වගන්ති වලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්:

1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කොළඹ - 15, අලුත්මාවත පාර, නො. 838/1ඒ දරන ස්ථානයේ පිහිටි "කොංගු වෙල්ලාලර් සංගම්" නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. සමාජයීය එකමුතුව.

ii. සමාජයට වෛද්‍ය, අධ්‍යාපනික සහ සංවර්ධන / ප්‍රවර්ධන සහය ලබා දීම.

2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා
සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය.

2026 අප්‍රේල් මස 27 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 05 - 0029/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.